සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# Provincial Department of Education - NWP

33 | S | I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## First Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : ......................................... ඉතිහාසය - I කාලය : පැය 01යි.

සැලකිය යුතුයි.

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමිවේ.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (5) ලකුණ යොදන්න.

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

1. ගම්පොල රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය සමය දක්වා ශ්‍රී ලංකාවේ ශාසන ඉතිහාසය හැදෑරීම සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට සුදුසුම මූලාශ්‍රය කුමක් ද?
(1) පූජාවලිය (2) රාජාවලිය (3) මහාවංසය (4) නිකාය සංග්‍රහය

2. රජරට ශිෂ්ටාචාර සමයේ ඉතිහාසය හැදෑරීම සඳහා තොරතුරු සපයාගත හැකි මූලාශ්‍රය පමණක් දක්වෙන පිළිතුර කුමක් ද?
(1) ධාතු වංසය හා සද්ධර්මාලංකාරය (2) ධාතු වංසය හා නිකාය සංග්‍රහය
(3) සද්ධර්මාලංකාරය හා හංස සන්දේශය (4) හංස සන්දේශය හා ධාතුවංසය

3. මහා වංසයට පාලි භාෂාවෙන් රචිත ටීකා ග්‍රන්ථය වන්නේ
(1) චූල වංසය (2) සම්මෝහ විනෝදනී (3) වංසත්ථප්පකාසිනි (4) සමන්තපාසාදිකාව

4. පහත සඳහන් මූලාශ්‍රය අතරින් ලංකා ඉතිහාසය හැදෑරීම සඳහා වැදගත්වන දකුණු ඉන්දීය මූලාශ්‍රය වන්නේ කුමක්ද?
(1) භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය (2) සීලප්පදිකාරම්
(3) යාල්පාන වෛපවමලෙයි (4) ඩිමුන්ඩෝ

5. ගල්, මැටිපුවරු, රන් තහඩු හා තඹ තහඩු වැනි මාධ්‍යය වල රචනාකර ඇති මූලාශ්‍රය හැඳින්වීම සඳහා පොදුවේ භාවිතා කරන නම කුමක්ද?
(1) සෙල්ලිපි (2) නාණක මූලාශ්‍රය (3) ටැම් ලිපි (4) අභිලේඛන

6. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා විසින් රචිත සෙල්ලිපියකි.
(1) ගල්පොත ලිපිය (2) පොත්ගුල් විහාර ලිපිය
(3) මිහින්තලා පුවරු ලිපිය (4) තෝනිගල ලිපිය

7. ශ්‍රී ලංකාවෙන් හමුවන පැරණිතම කාසි වර්ගය වන්නේ
(1) මස්ස ය. (2) ස්වස්තික කාසි ය. (3) ලැරිනය ය. (4) කහාපණ ය.

8. පහත I තීරුවේ සඳහන් තොරතුරු II තීරුවේ සඳහන් තොරතුරු සමග නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| 1. ග්‍රීක මූලාශ්‍රය | A පර්නා ඕ ඩී ක්වේරොස් ගේ ලංකාධිපත්‍යය |
| 2. රෝම මූලාශ්‍රය | B මෙගස්තිනිස්ගේ ඉන්ඩිකා |
| 3. චීන මූලාශ්‍රය | C ප්ලිනිගේ නැචුරාලිස් හිස්ටෝරියා |
| 4. පෘතුගීසි මූලාශ්‍රය | D හියුං සියැං භික්ෂුවගේ වාර්තා |

(1) A B C D (2) B D A C (3) B C D A (4) C A B D

9. ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ලියා තැබූ ඉබන් බතුතා කුමන ජාතිකයෙක් ද?
(1) අරාබි (2) චීන (3) ඕලන්ද (4) ඉංග්‍රීසි

10. මහනුවර යුගයේ සමාජ, දේශපාලනික තොරතුරු ලබා ගැනීමේ දී වඩා වැදගත්වන එදා හෙළදිව කෘතියේ කතුවරයා වන්නේ
(1) බැල්දියස් ය. (2) රිබෙයිරෝ ය (3)පාහියන් ය (4) රොබට් නොක්ස් ය.

11. ශ්‍රී ලංකාවේ සංස්කෘතික ඉතිහාසය හැදෑරීමේ දී වඩා වැදගත්වන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වර්ගය වන්නේ,
(1) කාසි (2) තඹපත් (3) චිත්‍ර මූර්ති (4) ආසන ලිපි

12. ශ්‍රී ලාංකික පුරවැසියන් ලෙස, ජාතික උරුමයක් වූ පුරාවස්තු ආරක්ෂා කරගත යුත්තේ මින් කවර හේතුවක් නිසාද?
(1) අනාගත පරපුරට දැකබලා ගැනීම සඳහා
(2) සංචාරකයින්ගේ අවධානය ලබා ගැනීම සඳහා
(3) අතීත නිර්මාණශීලී හැකියාව පිළිබඳ තොරතුරු රැකගැනීම සඳහා
(4) අපේ ජාතික අනන්‍යතාව පිළිබඳ කදිම සාධක වන හෙයිනි.

13. යාබද සිතියමෙහි ABCD හා E අක්ෂරවලින් දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පරිසර කලාප කිහිපයකි. ඒ අතරින් B හා D අක්ෂරවලින් දැක්වෙන පරිසර කලාප දෙක පිළිවෙළින්, නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?




(1) පහතරට වියළි කලාපය හා පහතරට තෙත් කලාපය
(2) අර්ධ ශුෂ්ක කලාපය හා තෙත් කලාපය
(3) කඳුකර වියළි අතරමැදි කලාපය හා පහතරට අර්ධ ශුෂ්ක කලාපය
(4) පහතරට තෙත් කලාපය හා පහතරට වියළි කලාපය

14. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සංස්කෘතික අවධි දෙක අතරින් දීර්ඝ කාලයක් පැවති යුගය කුමක් ද?
(1) ප්‍රාග්ඓතිහාසික ගල් යුගය (2) පූර්ව ඓතිහාසික යුගය
(3) මුල් ඓතිහාසික යුගය (4) ඓතිහාසික යුගය

15. ශ්‍රී ලංකාවේ පරිසර කලාප තීරණය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන සාධකය වන්නේ,
(1) ජල වහන රටාවයි. (2) වර්ෂාව ලැබෙන ක්‍රමයයි.
(3) වාර්ෂික වර්ෂාපතනයයි. (4) ගංගාවල පිහිටීමයි.

16. පහත සඳහන් ප්‍රාග්ඓතිහාසික ජනාවාස අතරින් වඩාත් පැරණිතම සාධක හමුවන ස්ථානය වන්නේ,
(1) පාහියංගල ය. (2) වැල්ලේගංගොඩ ය.
(3) කිතුල්ගල බෙලිලෙනය (4) කුරුවිට බටදොඹ ලෙනය.

17. පහතරට තෙත් කලාපයේ විසූ මානවයා වැඩි වශයෙන් තම ආහාරය සඳහා එක්කරගෙන ඇත්තේ
(1) ගොඩබිම බෙල්ලන් ය. (2) තලගොයා ය.
(3) මුවාය. (4) මුහුදු බෙල්ලන් ය.

18. ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා විසින් නිපදවාගනු ලැබූ දියුණු මෙවලම් විශේෂය වන්නේ මින් කුමක් ද?
(1) රළු ශිලා මෙවලම් (2) ජ්‍යාමිතික ක්ෂුද්‍රශිලා මෙවලම්
(3) පිළිස්සූ මැටි වලං (4) යකඩ මෙවලම්

19. අවධි කිහිපයකට අයත් පුද්ගලයින් නවදෙනෙකුගේ ඇටසැකිලි කොටස් හමුවන ප්‍රාග් ඓතිහාසික ජනාවාසය කුමක් ද?
(1) කිතුල්ගල බෙලිලෙන (2) බෙල්ලන්බැඳි පැලැස්ස
(3) පාහියන්ගල (4) රාවණා ඇල්ල

20. පහත සඳහන් ස්ථාන අතරින් පහතරට වියළි කලාපීය ලෙන් ජනාවාසයක් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) බටදොඹ ලෙන (2) බෙලිලෙන (3) පොතාන (4) පතිරාජවෙල

21. ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික යුගය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) සංචාරක ජීවිතය
(2) දඩයම් ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වීම
(3) ගොවිතැනට නැඹුරු වීම
(4) අවමංගල අභිචාරයක් ලෙස හිස්කබලේ අර්ධයක ගුරුගල් ආලේපය

22. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය පිළිබඳ සාක්ෂි වඩාත් පැහැදිලිව අනාවරණය වන ප්‍රදේශ වන්නේ
(1) උතුරු පළාතේ උතුරු කොටසේ හා නැගෙනහිර පළාතේ නිරිත දිග කොටසිනි.
(2) සබරගමු පළාතේ ඊසානදිග කොටසින් සහ ඌව පළාතේ නිරිත දිග කොටසිනි.
(3) මධ්‍යම පළාතේ ඊසාන දිග කොටසින් හා සබරගමු පළාතේ නිරිතදිග කොටසිනි.
(4) සබරගමු පළාතේ ඊසානදිග කොටසින් හා නැගෙනහිර පළාතේ නිරිතදිග කොටසිනි.

**පහත සඳහන් සිදුවීම් ඇසුරින් 23 හා 24 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A ගංගා හරස් කොට අමුණු ඉදිකිරීම
B ඉරණමඩු තැන්පතුව නිර්මාණය වීම
C ශිලා මෙවලම් භාවිතය සම්පූර්ණයෙන්ම අවසන් වීම
D ලෝකය උණුසුම් වීම නිසා කෘෂිකර්මාන්තයට උචිත පරිසරයක් ගොඩනැගීම

23. ඉහත සිදුවීම්වල අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර වන්නේ
(1) BDAC ය. (2) DBAC ය. (3) ABCD ය. (4) BDCA ය.

24. D අක්ෂරයෙන් දැක්වෙන සිදුවීම සිදු වූ භූ ගර්භ අවධිය කුමක් ද?

(1) ප්‍රාග් ඓතිහාසික ගල් යුගය (2) පූර්ව ඓතිහාසික යුගය

(3) හොලෝසීන යුගය (4) ප්ලයිස්ටොසීන යුගය

25. ''මුල් යකඩ යුගය'' නමින් හඳුන්වනු ලබන්නේ,

(1) ප්‍රාග් ඓතිහාසික ගල් යුගයයි (2) පූර්ව ඓතිහාසික යුගයයි

(3) මුල් ඓතිහාසික යුගයයි (4) ඓතිහාසික යුගයයි

26. උඩරංචාමඩම නේවාසික ප්‍රදේශයෙන් හමු වූ මැටි බඳුනට සමාන මැටි බඳුනක් හමුවන පූර්ව ඓතිහාසික යුගයට අයත් නේවාසික යුගය කුමක් ද?

(1) හල්දුම්මුල්ල (2) බෙරගල

(3) උඩරංචාමඩම පාසල් භූමිය (4) යාපහුව

27. පහත I තීරුවේ ශ්‍රී ලංකාවේ පැවති ග්‍රාමීය ජනාවාස කිහිපයක් දැක්වෙන අතර II තීරුවේ ඒවායේ ප්‍රධාන ආර්ථික කටයුතු දැක්වේ.

| I තීරුව | | II තීරුව | |
|---|---|---|---|
| 1 | කේවට්ටගම | A | වළං හදන්නන් විසූ ගම |
| 2 | මණික්කාරගම | B | ගොවියන් විසූ ගම |
| 3 | කුම්භකාර ගම | C | මැණික් හෑරූ හෝ මැණික් කැපූ අය විසූ ගම |
| | | D | ධීවරයන් විසූ ගම |
| | | E | ගොපල්ලන් විසූ ගම |

I තීරුව අනුව II තීරුව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) D C B (2) D C A (3) CDA (4) ABC

28. ''රාජ්‍ය'' යන සංකල්පය අර්ථ දැක්වීම සඳහා ඍජු ලෙස සම්බන්ධ නොවන ප්‍රකාශය වනනේ

(1) නීතිය (2) භූමිය (3) නිළධාරීන් (4) ජනතාව

29. 'කුලය යන පදය හැඳින්වීම සඳහා වඩාත් උචිත ප්‍රකාශය මින් කුමක් ද?

(1) පුද්ගලයාගේ උස් පහත් භේදය සලකන සාධකයකි

(2) සමාජයේ විසූ ධනවත් පිරිස හැඳින්වූ ප්‍රකාශයකි

(3) පවුල යන්න හැඳින්වීමට යෙදූ පදයකි

(4) සාහිත්‍ය මූලාශ්‍රයන්හි ගම්මාන හැඳින්වීමට යෙදූ නමකි

30. අතීත ජනයා අතර සිටි ප්‍රභූවරුන්ගේ සුඛිත මුදිත බව හෙළිවන පහත සඳහන් පළඳනාව හමු වූ ස්ථානය කුමක් ද?



(1) සීගිරිය

(2) යාපහුව

(3) කළුදිය පොකුණ

(4) ඉබ්බන්කටුව

31. ක්‍රි. පූ. 250 තරම් ඈත කාලයේ රචිත බ්‍රාහ්මී සෙල්ලිපියක ''පුර කමත'' ලෙස හඳුන්වා ඇත්තේ කවුරුන්ද?

(1) නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියාය (2) නගර පරිපාලකයාය

(3) වෙළෙඳ කටයුතු භාර ප්‍රධානියාය (4) ලේඛන කටයුතු භාර ප්‍රධානියාය.

32. ගම් තුනක නායකයින් තිදෙනෙකු සුහදව ලෙනක් පිරිසිදු කර භික්ෂූන් වහන්සේලාට පූජා කිරීම පිළිබඳ තොරතුරු සඳහන් අභිලේඛනය කුමක් ද?

(1) අනුරාධපුර පෙරිය පුලියන් කුලම ලිපිය (2) දඹුල්ල කොත්ගල්කන්ද ලිපිය

(3) සිතුල්පව්ව කොරවක්ගල් ලිපිය (4) මාතලේ ඇඹුල්අඹේ ලිපිය

33. ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විමධ්‍යගතව පැවති අවධියේ පරුමක වරුන්ගේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරනු ලැබුවේ.

(1) ගහපති (2) ගමික (3) මහමත (4) මපුරුමුකා

34. ශ්‍රී ලංකාවේ දේශපාලන කටයුතු සඳහා දායක වූ පාලකයින් කිහිප දෙනෙකු සම්බන්ධ තොරතුරු කිහිපයක් පහතින් දැක්වේ.

A පරිපාලන දිස්ත්‍රික්ක වෙන්කොට ඒවා පාලනයට ඇමතිවරු පත්කිරීම

B ''නර ඉසෙර'' යනුවෙන් හඳුන්වා තිබීම

C මව් උරුමයෙන් රාජ්‍යත්වයට පත්වීම

D වල්ලිපුරම් සන්නස

ඉහත තොරතුරු අතුරෙන් වසභ රජතුමා හා සම්බන්ධ තොතුරු පමණක් සඳහන් පිළිතුර වන්නේ

(1) A හා B ය. (2) B හා C ය. (3) A හා D ය. (4) D හා E ය.

35. පහත සඳහන් පාලකයින් අතරින් පළමුව රෝහණය එක්සත් කොට එහි බලයට පත්ව, දෙවනුව චෝළයින් පරදවා රජරට බලයට පත් පාලකයා වන්නේ කවුරුන් ද?

(1) I විජයබාහු රජතුමා (2) පළමුවැනි පැරකුම් රජතුමා

(3) වසභ රජතුමා (4) කාවන්තිස්ස රජතුමා

පහත A, B, C හා D වලින් දැක්වෙන ප්‍රකාශ පද යුගල අධ්‍යයනය කර අංක 36 සිට 38 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A 1. ආර්රීකය
2 නාණක මූලාශ්‍රය

B 1. ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම්
2. කැපීම, සිරීම, හැරීම

C 1. ශිලා මෙවලම්
2. මැටිඹරු සුසාන

D 1. මණිකාරගාම
2. ගම් වැව්

36. දෙවැන්න ඉටුකරගැනීම සඳහා පළමුවැන්න උපයෝගී කරගත හැකි බව ප්‍රකාශවන පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

37. පළමුවැන්න පිළිබඳ තොරතුරු සොයාබලා තහවුරු කිරීම සඳහා දෙවැන්න උපයෝගී කරගත හැකි බව ප්‍රකාශවන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

38. දෙවැන්නේ පෞරාණික බව තහවුරු කිරීම සඳහා පළමුවැන්න ප්‍රයෝජනවත් වූ බව පෙන්වන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

39. ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසුව ගොඩනැගුණු පරිපාලන සැලැස්මේ දී ''කනපෙඩික'' නම් නිලධාරියා හට හිමි වූ කාර්යය වන්නේ,

(1) කාසි අච්චු ගැසීමේ ප්‍රධානී (2) වෙළඳ කටයුතු භාර ප්‍රධානී

(3) රාජ්‍ය ලේඛනගාර ප්‍රධානී (4) වාස්තු විද්‍යා අංශ ප්‍රධානී

40. තමන් හැඳින්වීම සඳහා ''කාලිංග චක්‍රවර්තී ස්වාමීන් වහන්සේ'' යන විරුදය භාවිතා කළ පාලකයා

(1) කාලිංඝ මාඝ ය (2) භාතිකාභය රජුය (3) මහසෙන් රජුය (4) නිශ්ශංකමල්ල රජුය

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

**Provincial Department of Education - NWP**

33 | S | I

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# First Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : .......................................... **ඉතිහාසය - II** කාලය : පැය 02යි.

සැලකිය යුතුයි.

- I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

01. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) සෙංකඩගල, අනුරාධපුරය, හලාවත, මල්වතුඔය, සීගිරිය, කැළණි ගඟ, ගාල්ල, පරාක්‍රම සමුද්‍රය, එලිෆන්ට්පාස්, සූකර තිත්ථ, තිකුණාමලය, බුන්දල (ලකුණු 12)

(ii) පර්සියන් බොක්ක, ඉතාලිය, ජාවා දූපත, පෝක් සමුද්‍ර සන්ධිය, ගෝව, ජපන් දූපත් (ලකුණු 06)

(ආ) පහත A, B, C, D යන ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ලියන්න.

A වසභ රාජ සමයේ දී යාපන ප්‍රදේශය පාලනය කළ අමාත්‍යවරයා

B ශ්‍රී ලංකාවේ පැරණිතම සෙල්ලිපි වර්ගය

C ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය සම්බන්ධයෙන් පැරණිතම සාධක හමුවන වෙරළාශ්‍රිත එළිමහන් කඳවුර

D ශ්‍රී ලාංකික දූත පිරිසක් රෝමයට ගොස් වීදුරු පබළු ගෙන ආ අවධියේ ලංකාවේ සිටි පාලකයා

(ඇ) A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න. (ලකුණු 04)

(i) A වලින් දැක්වෙන සොහොන් විශේෂය හඳුනාගෙන නම් කරන්න.

(ii) මෙම සුසානය පිහිටි ස්ථානය කුමක්ද?

(iii) මෙම නිර්මාණ කුමන යුගයකට අයත්වේ ද?

(iv) මෙම සොහොන් ගැබ තුළ පිහිටි මැටි බඳුන්වල තැන්පත් කර ඇත්තේ මොනවා ද? (ලකුණු 04)

A



B



(ඈ) (i) B වලින් දැක්වෙන නිර්මාණය හඳුනාගෙන නම් කරන්න.

(ii) මෙම ලේඛනය නිකුත් කරන ලද පාලකයා කවුරුන් ද?

(iii) මෙම ලේඛනය නිර්මාණය කර ඇති මාධ්‍යය කුමක් ද?

(iv) මෙම ලේඛනයේ යමෙකුට ලබාදුන් දීමනාවක් පිළිබඳ තොරතුරු සඳහන් වේ. එහි සඳහන් දීමනා ලාභියා කවුරුන් ද? (ලකුණු 04)

## II කොටස

02. (i) පහත සඳහන් විදේශීය මූලාශ්‍රයන්හි කතුවරුන් වරහන් තුළින් තෝරා A, B හා C අනුපිළිවෙළින් නම් කරන්න.

A ලංකා ඉතිහාසය
B ඩිමුන්ඩෝ
C භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය

(රිබෙයිරෝ, ඇරිස්ටෝටල්, ක්ලෝඩියස් ටොලමි) (ලකුණු 03)

(ii) ඉතිහාසය ගොඩනැගීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය යොදා ගැනීමේ දී අවධානය යොමු කළයුතු කරුණු 04ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී මහා වංසයේ ඇති වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) සෙල්ලිපි පිහිටුවීමේ ප්‍රධාන අරමුණු තුනක් නම් කර සෙල්ලිපි වර්ග පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06)

03. (i) ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී වැදගත්වන දකුණු ඉන්දීය සාහිත්‍ය මූලාශ්‍ර තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) A මහා වංසයේ කතුවරයා හා රචිත කාල වකවානුව නම් කරන්න.
B මූලාශ්‍රයක් ලෙස දීපවංශයෙහි ඇති දුබලතා දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ඉතිහාසය හැදෑරීමේ දී සාහිත්‍ය මූලාශ්‍රවල ඇති ප්‍රයෝජන දෙකක් දක්වා ඒ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පුරා විද්‍යාත්මක මූලාශ්‍රවල වැදගත්කම කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

04. (i) (a) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගල් යුගයට අයත් සාධක පාංශු ස්ථර අතර තැම්පත් වූ අවධිය කුමක් ද?
(b) ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් සාධක හමුවන ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 03)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පහතරට තෙත් කලාපීය ලෙන් දෙකක් හා පහතරට වියළි කලාපීය ලෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ප්‍රධාන ලක්ෂණ දෙකක් ඇසුරින් ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවනෝපාය මාර්ගය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ප්‍රාග් ඓතිහාසික ගල් යුගයට සාපේක්ෂව පූර්ව ඓතිහාසික යුගයේ පැවති සුවිශේෂ ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

05. (i) මහාවංශයේ සඳහන් වාපී ගම්මාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) මුල් ඓතිහාසික යුගයට අයත් පහත ගම්මානවල සිදු වූ කාර්යයන් හෝ වෘත්තීන් නම් කරන්න.

a - කසීකාරගාම
b - ගෝපාල ගාම
c - නිගම
d - ඔලගම් (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික යුගයට අයත් ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක දෙකක් නම්කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වල ව්‍යුහය හා ස්වරූපය කරුණු තුනක් ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

06. (i) පූර්ව රාජ්‍ය සමයේ දී ශ්‍රී ලංකාවේ පාලන කටයුතුවලට සම්බන්ධ වූ පහත සඳහන් පුද්ගලයින් සෙල්ලිපිවල හඳුන්වා ඇති ආකාරය නම් කරන්න.

a) පවුලක ප්‍රධානියා
b) ගමක ප්‍රධානියා
c) තොටුපළ ආශ්‍රිත ප්‍රදේශයක් පාලනය කළ පරුමකවරයා (ලකුණු 03)

(ii) a) වැව් පද්ධතියක් නිර්මාණය කිරීමේ අරමුණු දෙක මොනවාද? (ලකුණු 02)
b) අතීත වැසියා ගම් වැව් පද්ධති හඳුන්වා ඇති නම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) පූර්ව රාජ්‍ය සමයේ පැවති දසගම් මණ්ඩලයෙන් ඉටු වූ කාර්යයන් දෙකක් දක්වා ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) පණ්ඩුකාභය රාජ්‍ය සමයේ ඇති දේශපාලන වැදගත්කම කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

07. (i) ගමික විසින් ගම නියෝජනය කරමින් අවට ගම්මාන සමග කටයුතු කළ අවස්ථා 03ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු ගොඩනැගුන රාජ්‍ය පාලන සැලැස්මට පත් වූ පහත නිලධාරීන් සෙල්ලිපිවල හඳුන්වා ඇති ආකාරය නම් කරන්න.

a) - භෝජනශාලාධිකාරී
b) - නාගරික වාස්තු විද්‍යාඥ
c) - වත්සිරිත් හා චාරිත්‍ර පිළිබඳ අධිකාරී
d) - භාණ්ඩාගාරික (ලකුණු 04)

(iii) දුටුගැමුණු රජුතුමාගෙන් ඉටු වූ දේශපාලනමය වශයෙන් වැදගත් කාර්යයන් දෙකක් උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) රජුගෙන් රටවැසියා බලාපොරොත්තු වූ යුතුකම් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

08. (i) පහත සඳහන් රාජ්‍යත්ව සංකල්ප දැරූ පාලකයා බැගින් නම් කරන්න.

a - නරඉසෙර
b - දේවත්ව
c - අලකපය මහරජ (ලකුණු 03)

(ii) අතීත ශ්‍රී ලංකාවේ පිය උරුමයෙන් රාජ්‍ය හිමිකම ලැබූ අවස්ථා දෙක නම් කර එම අවස්ථා දෙකට උදාහරණ එක බැගින් සපයන්න. (ලකුණු 04)

(iii) I විජයබාහු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) පූර්ව රාජසමයේ බිහි වූ පාලකයෙකු ලෙස පරුමක වරයාගේ කාර්යය භාරයන් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

09. (i) අතීත ශ්‍රී ලංකාවේ පරිපාලන කටයුතු හා සම්බන්ධ ආයතන කිහිපයක් පහතින් දැක්වේ. එම ආයතනවලට සම්බන්ධ කාර්යයන් ලියා දක්වන්න.

a - එක්තැන්සමිය
b - වත්හිමි
c - සභාව (ලකුණු 03)

(ii) පහතින් දක්වා ඇති කාර්යයන් හා සම්බන්ධ පාලකයින් වරහන තුළින් අනුපිළිවෙළින් තෝරා ලියන්න.

1. ''උපසග්ග රෝග නාස'' නම් රෝහල් ඉදිකිරීම
2. ''පසවන්ති නාමසාලා'' ඉදිකිරීම
3. සොත්ථිසාලා ඉදිකිරීම
4. රෝහල් ඉදිකිරීම හා වෛද්‍යවරයකු ලෙස කටයුතු කිරීම

(බුද්ධදාස රජතුමා, iv කාශ්‍යප රජතුමා, පණ්ඩුකාභය රජතුමා, පළමුවන උපතිස්ස රජතුමා, පස්වන මිහිඳු රජතුමා) (ලකුණු 04)

(iii) අතීතයේ ජනයා හේන් වගාව සිදු කළ අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) අතීත පාලකයින් අවට රාජ්‍යයන් සමග සුහදව කටයුතු කර ඇත. නිදසුන් තුනක් මගින් ඒ පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

1. (අ) (i)

1. (அ) (i)

1. (a) (i)



සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

33 | S | I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 10 - 2019

### ඉතිහාසය පිළිතුරු පත්‍රය

I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (4) | 11. | (3) | 21. | (3) | 31. | (1) |
| 2. | (1) | 12. | (4) | 22. | (2) | 32. | (3) |
| 3. | (3) | 13. | (1) | 23. | (4) | 33. | (4) |
| 4. | (2) | 14. | (1) | 24. | (3) | 34. | (3) |
| 5. | (4) | 15. | (3) | 25. | (2) | 35. | (1) |
| 6. | (1) | 16. | (2) | 26. | (1) | 36. | (2) |
| 7. | (4) | 17. | (1) | 27. | (2) | 37. | (1) |
| 8. | (3) | 18. | (2) | 28. | (1) | 38. | (3) |
| 9. | (1) | 19. | (3) | 29. | (3) | 39. | (3) |
| 10. | (4) | 20. | (3) | 30. | (4) | 40. | (4) |

ල. 40 5 2 = 80)

I කොටස

01. (අ) (i)







(ආ) (i) A ඉසිගිරිය
B ලෙන්ලිපි
C පතිරාජවෙල
D භාතිකාභය රජු (ල. 4)

(ඇ) (i) මහා ශිලා සුසාන/ශිලා මංජුසා සොහොන්
(ii) ඉබ්බන්කටුව
(iii) පූර්ව ඓතිහාසික යුගය/මුල් යකඩ යුගය/මෙගලිතික යුගය
(iv) හෂ්මාවශේෂ (ල. 4)

(ඈ) (i) පනාකඩුව සන්නස
(ii) පළමුවන විජයබාහු රජතුමා
(iii) තඹ (තඹ පත්‍රය)
(iv) සිත්නාරුබිම් බුදල්නා/බුද්ධරාජ (ල. 4)

## II කොටස

02. (i) A රිබෙයිරෝ
B ඇරිස්ටෝටල්
C ටොලමි (ල. 3)

(ii) මූලාශ්‍රය රචනා වූ කාලය
මූලාශ්‍රයේ කතුවරයා
කතුවරයාගේ අරමුණු
මූලාශ්‍රයට කරුණු සපයාගත් ආකාරය
(ල. 4)

(iii) ශ්‍රී ලංකාවේ අඛණ්ඩව ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් ම මූලාශ්‍රය වීම
බුද්ධකාලයේ පටන් මහසෙන් රාජ්‍ය සමය අවසානය දක්වා තොරතුරු ලබාගත හැකිවීම.
ආගමික, දේශපාලන, ආර්ථික, සංස්කෘතික තොරතුරු රැසක් ආවරණය කරගත හැකිවීම.

(iv) විහාරාරාමවලට ගම්බිම් පිදීම
විහාරාරාම පාලනය
රජයේ නීති රීති අනපනත් ප්‍රසිද්ධ කිරීම
බදු අයකිරීම
වෙළෙඳාම
වැරදිකරුවන්ට සමාව දීම
පුද්ගලයින්ගේ සේවය අගය කිරීම. ආදිය මඟින් විස්තර කිරීම (ල. 6)

03. (i) සිලප්පදිකාරම්, මණිමේඛලයි, පදිර්රුප්පත්තු

(ii) A මහා නාම හිමි - ක්‍රි. ව. 5/6 සියවස්වල
B සංක්ෂිප්ත බව, පුනරුක්ත දෝෂ වැදගත් කරුණු මඟ හැරීම. (ල. 3)

(iii)
- ඓතිහාසික කාල අනුපිළිවෙළ සකස්කර ගැනීම.
- එක් එක් අවධිවල දේශපාලන, ආර්ථික සමාජ සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගැනීම.
- එක් මූලාශ්‍රයකින් ලැබෙන තොරතුරු තවත් මූලාශ්‍රයකින් සනාථ කර ගැනීම
- විදේශ සබඳතා අධ්‍යයනය කිරීම (ල. 4)

(iv)
- පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර මගින් වඩා විශ්වසනීය සමකාලීන තොරතුරු අනාවරණය වීම.
- සාහිත්‍ය මූලාශ්‍රවල ඇති තොරතුරු පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර වලින් සනාථ කරගත හැකිවීම.
- සාහිත්‍ය මූලාශ්‍රවල අඩුපාඩු පූරණය කරගැනීම.
- නව තොරතුරු අනාවරණය
- පූර්ව රාජ සමය පිළිබඳ බොහෝ තොරතුරු අනාවරණය වීම. (ල. 5)

04. (i) a ප්ලයිස්ටොසින යුගය
b ඉරණමඩු සැකැස්ම - රත්නපුරය අවට මැණික් පතල්වල ඉල්ලම් පස් තට්ටුව

(ii) පහතරට තෙත් කලාපීය ලෙන් - පාහියන්ගල, බටදොඹලෙන, බෙල්ලන්බැඳි පැලැස්ස, මානියාගම
පහතරට වියළි කලාපීය ලෙන් - පොතාන අලිගල (ල. 4)

(iii) දඩයම
වන ද්‍රව්‍ය රැස් කිරීම
දඩයම් කළ සතුන් දඩයම් කළ ආකාරය භාවිතා කළ මෙවලම් ආදිය විස්තර කිරීම, රැස්කර වන ද්‍රව්‍ය ආදිය පිළිබඳ විස්තර කිරීම.

(iv) දඩයම හා වන ද්‍රව්‍ය රැස්කිරීම ක්‍රමයෙන් කෘෂිකර්මයට නැඹුරුවීම
සංචාරික දිවිපෙවත අතහැර - ස්ථිරවාසීතාවය ආරම්භ කිරීම
ස්ථිර ජනාවාස නැත. ගම්මාන බිහිවීම නිසා ජනාවාස බිහිවීම.
ක්‍රමවත් සුසාන ක්‍රම ආරම්භය
පිළිස්සූ මැටි වළං භාවිතය
ශිලා මෙවලම් භාවිතය ක්‍රමයෙන් අතහැර යකඩ මෙවලම් භාවිතයට හුරුවීම.

05. (i) සුමනවාපී, විහාර වාසී, කඩහවාරපී, හුන්දරී වාපී (ල. 3)

(ii) a ගොවියන් විසූ ගම
b ගොපල්ලන් විසූ ගම
c වෙළෙඳ ගම්
d ජනතාව විසින් අතහැර දමූ වැව් ගම්
(ල. 4)

(iii) වාර්ෂික වර්ෂාපතනය
භූ විෂමතාව
පසේ ස්වභාවය
ජල වහනය
} කෘෂිකර්ම කටයුතු සඳහා වැදගත්වීම
ස්වාභාවික සම්පත් ව්‍යාප්තිය - කර්මාන්ත සඳහා වැදගත් වීම ආදී කරුණු 2ක් විස්තර කරන්න.
(ල. 5)

(iv)
- ගංගා නිම්නවලට පිටතින් ජනාවාස

- පිහිටවා ගැනීම.
- ගම්මාන එකින් එකට වෙන්ව පැවතීම (කුඩා වන රොදකින්)
- වාපී ගම්මාන ලෙස හැඳින්වීම.
- සෑම ගමක වැව් දක්නට ලැබීම.
- වෘත්තීන් අනුව ගම්මාන වෙන්ව පැවතීම.
- සමහර ගම් වැටකින් ආරක්ෂා වී තිබුණු බව.
- තමාගේ ගමට සාපේක්ෂව අනෙක් ගම්මාන හඳුන්වා ගැනීම.
- වරිච්චි නිවාස
- වටකුරු හැඩයේ හා චතුරස්‍රාකාර නිවාස තිබී ඇති බව.

06. (i) a ගහපති
b ගමික
c තොටබොජක

(ii) a - ජල සංරක්ෂණය (ඉහළ වැවක අතිරික්ත ජලය පහළ වැවකට ලබා ගැනීම)
- තෙතමනය ඉහළ නැංවීම

b - වැව් ප්‍රපතනය, එල්ලංගාව

(iii)
- දසගම් ප්‍රදේශයේ පරිපාලන ගැටළු විසඳීම
- බෞද්ධ විහාරාරාම සම්බන්ධ ගැටළු විසඳීම
- දසගම් අතර සුහද බව ආරක්ෂා කිරීම.

(iv)
- ප්‍රාදේශීය පාලකයන් කිහිප දෙනෙකු යටත් කර විශාල ප්‍රදේශයක බලය ලබා ගැනීම (මාමාවරුන් දස දෙනා පරාජය)
- අනුරාධපුර අගනගරය ගොඩනැගීම
- දිවයිනේ ග්‍රාම සීමා ලකුණු කිරීම (ල. 6)

07. (i)
- ආවහ-විවාහ කටයුතුවලදී
- භාණ්ඩ හුවමාරු කර ගැනීමේ දී
- විවිධ ආරවුල් විසීඳීමේ දී

(a) බතගු
(b) නගර වුඩික
(c) කොතුරු ගැනා
(d) බඩගරික

(iii) එළාර රජුගෙන් රජරට මුදවා ගැනීම
ලංකාව පළමුවරට එක්සේසත් කිරීම
රාජතාන්ත්‍රික බව
දේශපාලන කටයුතු සඳහා ශක්තිමත් පදනමක් නිර්මාණය

(iv)
- රටේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා කටයුතු කිරීම
- රටේ ආර්ථික සංවර්ධනය
- ආගමික කටයුතු සඳහා අනුග්‍රහ දැක්වීම.
- අභ්‍යන්තර/බාහිර අභියෝගයන්ගෙන් රාජ්‍ය මුදවා ගැනීම.
- රටේ ආදායම වැඩි දියුණු කිරීම.

08. (i) a කූටකණ්ණ අභය රජතුමා
b මහසෙන් රජතුමා
c පළමු කාශ්‍යප රජතුමා (ල. 3)

(ii) පිය උරුමය
I සහෝදරයාගෙන් සහෝදරයාට - දුටුගැමුණුගෙන් සද්ධාතිස්සට
II පියාගෙන් පුතාට - කාවන්තිස්ස ගෙන් දුටුගැමුණුට

(iii)
- චෝලයන් පරදවා ලංකාව එක්සේසත් කිරීම
- පොළොන්නරුව ලංකාවේ අග නගරය බවට පත්කර ගැනීම
- පාලන කටයුතු විධිමත් කිරීම
- කෘතගුණ සැලකීම

(iv) ගම්වැව් පද්ධතියක නායකයා ලෙස කටයුතු කිරීම.
වැව් පද්ධතිය නඩත්තු කිරීම
වැව් පද්ධතියේ ජනතා ගැටළු විසඳීම (ල. 6)

09. (i) a ව්‍යවස්ථාදායක හා විධායක කටයුතු
b රජු
c අධිකරණය (ල. 3)

(ii) a iv කාශ්‍යප රජු
b I උපතිස්ස
c පණ්ඩුකාභය රජු
d බුද්ධදාස රජු (ල. 4)

(iv)
- I ගජබාහු රජු පත්තිනි දේවාලයක් විවෘත කිරීම සඳහා චේර දේශයට යාම
- කණිට්ඨතිස්ස රජු රෝමයට දූතයන් යැවීම
- VI වන අක්බෝ රාජ සමයේ දී චීනයට 20 වතාවක් දූත ගමන් සිදු කිරීම.
- පළමුවන විජයබාහු රජතුමා කාලිංග වංශික තිලෝසුකසුන්දරී බිසව විවාහ කර ගැනීම
- පළමුවිජයබාහු රජතුමා පොළොන්නරු දළදා මාලිගාවේ ආරක්ෂාව වේලක්කාර කුලී හමුදාවට පැවරීම.